FOKUS WOMEN

# ශ්‍රී ලංකාවේ යුද්ධයේ බලපෑමට හසු වූ උතුරු පළාතේ කාන්තා ගෘහ මූලිකයින් ලිංගිකව සූරාකෑම

## පසුබිම

ස්ත්‍රී පුරුෂ සමාජභාවය විසින් නිර්මාණය කරන ලද අවදානම් සහගත බව හේතුවෙන් සිදුවන දූෂිත තත්ත්වයන්හි වින්දිතයින් බවට, කාන්තාවන් විවිධ අයුරින් පත්විය හැකිය. විශේෂයෙන්ම කාන්තාවන්ට බලපාන විවිධ ආකාරයේ දූෂණයන් බහුලව පවතින නමුත්, ඒවා හැමවිටම දූෂණයන් ලෙස හඳුනා නොගැනීම සහ ලිංගික අපරාධ හා බැඳුණු ලැජ්ජාව යන කරුණු හේතු කොට ගෙන, මෙබඳු ක්‍රියාකාරකම් වාර්තා වීමෙන් හා පියවර ගැනීමෙන් වැළකී යයි.



උතුරේහි යුද්ධය අවසන් වීම කාන්තාවන්ට නව අභියෝගයන් රැගෙන ආවේය. නීතිය ක්‍රියාත්මක කිරීම, ආරක්ෂාව සම්බන්ධව කටයුතුකරන රාජ්‍ය නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් අතින් ද කාන්තාවන් ලිංගික සූරාකෑමට ලක්වීම පිළිබඳ ව මානව හිමිකම් සංවිධාන වාර්තා කොට තිබේ. විශේෂයෙන්ම පශ්චාත් යුධ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සමග රජය ඉදිරියට යන සන්දර්භය තුළ, අදාළ බලධාරීන්ගේ ඉක්මන් අවධානයට මෙම ලිංගික සූරාකෑම පිළිබඳ නැගී එන ප්‍රවණතාව අවධානයට ලක්විය යුතුය.

**මෙම අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස් ලබාදීම වැළැක්වීම සඳහා වන වත්මන් නීතිමය රාමුව පිළිබඳ ව සාකච්ඡා කෙරේ. එමෙන්ම විශේෂයෙන් යුද්ධයේ බලපෑම ලත් උතුරු පළාතේ කාන්තා ගෘහ මූලිකයින්ගේ අවදානම් සහගත සන්දර්භය අවධාරණය කිරීම සඳහා සිද්ධි අධ්‍යයනයන් 25ක් සාකච්ඡා කෙරේ.**

## අර්ථ දැක්වීම

ලිංගික සූරාකෑම හෝ අල්ලස් ලබාදීම සම්බන්ධයෙන් අදාළ වන නීතිය, එකී ක්‍රියාවේ ස්වභාවය සහ එය සිදුවන සන්දර්භය මත වෙනස් විය හැකිය. මෙම කාරණය සඳහා අදාළ වන අන්තර්ජාතික හා දේශීය නීතිය සහ නඩු තීන්දු නීතිය පිළිබඳ පුළුල් වපසරිය තුළින් මෙය සාක්ෂාත් වේ. කෙසේවුවත්, මෙම අධ්‍යයනයේ අරමුණ සඳහා;

- ලිංගික අල්ලස් යන්න අර්ථ නිරූපණය කළ හැක්කේ, බලයේ සිටින පිරිමින් විසින් කිසියම් සේවාවක් හෝ උදව්වක් කිරීම සඳහා, පුද්ගලයකුගෙන් (අපගේ පර්යේෂණය තුළ සිය පවුල්වල මූලිකත්වය දරන කාන්තාවන්) ඉල්ලා සිටින ස්වභාවයෙන් ලිංගිකමය වූ ‘අයුතු ප්‍රතිලාභයක්’ ලෙස ය.
- ලිංගික සූරාකෑම යනු ගෙවීමක් සඳහා හුවමාරුවට ලිංගික ක්‍රියාකාරකමක් ඉල්ලා සිටීමයි. මෙය, යමකුගේ කැමැත්ත හෝ දැනීමකින් තොරව, තර්ජනය කිරීම මගින් හෝ බලය පාවිච්චි කිරීමෙන් හෝ වෙනත් බලකිරීමක් හරහා ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙයට බලය සහ යමකුගේ අසරණභාවය අයුතු අන්දමින් භාවිත කිරීම හෝ තවත් අයකුගේ පාලනයට නතු වී සිටින පුද්ගලයකුගේ කැමැත්ත ලබා ගැනීම සඳහා ගෙවීම්/ප්‍රතිලාභ ලබාදීම හෝ ලැබීම ද ඇතුළත් වේ.
- ලිංගික සූරාකෑම යනු ලිංගික අල්ලස් පිළිබඳ වර්ගීකරණය ඇතුළත් වන පුළුල් සංකල්පයයි. එහෙයින්, ලිංගික අල්ලස් යනු, ලිංගික සූරාකෑමේ එක් ක්‍රමයකි.

## ක්‍රමවේදය

- මෙම පර්යේෂණය සිදු කරන ලද්දේ, ලිංගික සූරාකෑම පිළිබඳ ව පැමිණිලි ඉදිරිපත් වන උතුරෙහි උනන්දුවක් දක්වන විවිධ කණ්ඩායම් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුවය.

- නිවසෙහි පිරිමියකු නොසිටීම හේතුවෙන් වඩාත් ලිංගික අතවරවලට බඳුන් වන්නේ සහ ලිංගික සූරාකෑමට යටත් වන්නේ කාන්තා ගෘහ මූලිකයින් වන නිසා ඔවුන් ඉලක්කගත කණ්ඩායම් විය.

- යුද්ධයේ බලපෑම ලත් උතුරු පළාතේ දිස්ත්‍රික්ක 05 තුළම පර්යේෂණය සිදු කරනු ලැබීය.

- උතුරෙන් පලවා හරිනු ලැබූ මුස්ලිම් අභ්‍යන්තර අවතැන් වූ කාන්තාවන්ගේ අත්දැකීම් ඇතුළත් කිරීම සඳහා, වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය ද ඇතුළත් කරනු ලැබීය.

- සිද්ධි අධ්‍යයනයන් 25ක් සිදු කරන ලදී. (දෙමළ 21, මුස්ලිම් 04)

- සිද්ධි අධ්‍යයනයන් සඳහා සම්මුඛ සාකච්ඡා 10ක් පවත්වන ලදී. සම්මුඛ සාකච්ඡා මෙහෙය වූවන් කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිනියන් වූ අතර, ඉන් සමහරක් වෘත්තිමය උපදේශනය සඳහා පුහුණුව ලැබුවෝ වූහ.

- රජයේ නිලධාරීන් සමග ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා ද පවත්වන ලදී.

## සොයා ගැනීම්

***උතුරෙහි කාන්තාවන් ලිංගික සූරාකෑමට ලක්වීම ඉහල යාමට හේතු:***

- පවුලේ පිරිමි සාමාජිකයින් මියයාම සහ/හෝ අතුරුදහන් වීම හේතුවෙන්, කාන්තා ගෘහ මූලිකයින් සංඛ්‍යාව අධික ලෙස ඉහල යාම.

- යුද්ධයෙන් පසුව මිලිටරිකරණය ඉහල යාම.

- යළි පදිංචි කිරීමේ හා සංවර්ධ සැලසුම් තුළට ඔවුන්ගේ අත්දැකීම් ඇතුළත් කිරීමට අසමත් වීම.

- තීරණ ගැනීමේ තලයන්හි කාන්තා ගෘහ මූලිකයන්ගේ සහභාගීත්වය හා නියෝජනය තහවුරු කිරීමට අසමත් වීම.

- නීතිය ක්‍රියාත්මක වීම අක්‍රිය වීම හා දූෂණය සමග බැඳුණු යුක්ති ක්‍රියාදාමය තුළ සිදුවන ප්‍රමාදයන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීබවක් නොමැති වීම.

## වින්දිතයින් පිළිබඳ තොරතුරු

- මෙබඳු ලිංගික සූරාකෑමට ලක් වූ වින්දිතයින් ප්‍රධාන වශයෙන්ම, වයස 25 - 35 අතර වැන්දඹු බවට පත්, දෙමළ කාන්තාවෝ වෙති.

- බොහෝ දෙනාට යැපෙන දරුවන් හෝ වැඩිහිටියන් සිටින අතර, ආදායම උපයන්නන් හා රැකබලා ගන්නන් ලෙස බහුවිධ භූමිකාවන් ඔවුනට පැවරී තිබේ.

- මුස්ලිම් කාන්තාවන් තිදෙනෙකුගේ අත්දැකීම් කාති උසාවිවලින් සේවා ලබා ගැනීම හා සම්බන්ධ විය.

- එකම නිලධාරීන් විසින් ලිංගික අල්ලස් ඉල්ලා තිබූ අවස්ථා අඩුම තරමේ හතරක්වත් විය.

- කාන්තාවන් දහනව දෙනෙක් නිවාස හෝ ඒ සම්බන්ධ උදව් ලබා ගැනීම, ජීවනෝපාය සහාය හෝ රැකියා ලබා ගැනීම සඳහා රාජ්‍ය සේවාවන් අවශ්‍ය වූ මව්වරු වූහ.

- තමාට මුදල් හෝ වෙනත් වත්කම් නොතිබූ නිසා ලිංගික සූරාකෑමට බඳුන් වීමට සිදු වූ බව කාන්තාවෝ විශ්වාස කළහ.

- තමා හුදෙකලාව ජීවත් වූ නිසා එකී පිරිමි තමා ගොදුරු ලෙස දුටු බව බොහෝ කාන්තාවෝ අවධාරණය කළහ.

- අප කතාබහ කළ කාන්තාවන්ගෙන් විසි දෙදෙනෙකුම සිය ආතතියෙන් මිදීම සඳහා උපදේශකයින් හෝ වෘත්තිමය උපදෙස් ලබාගෙන නොතිබිණි.

- උපදේශනය හෝ මානසික ප්‍රතිකාර ලබා ගෙන තිබුනේ කාන්තාවන් දෙදෙනෙකු පමණි.

- කාන්තාවෝ අට දෙනෙකු නිහඬව වේදනාවට පත් වූ අතර, ඔවුන් මේ වන විට ද වේදනා විඳිමින් සිටිති.

- මුලදී කතාබහ කිරීමට පසුබෑමක් දැක් වූ නමුත්, හය දෙනෙකු පළමු වතාවට එකී සිද්ධීන් ආවර්ජනය කළ අතර, ඉන් පසුව සහනයක් දැනුණු බව ප්‍රකාශ කළහ.

- කතා කිරීමෙන් පසුව චූදිතයා පිළිබඳ ව නිරීක්ෂණය කිරීමටත්, ඔහුට දඬුවම් කිරීම සඳහා සාක්ෂි එකතු කිරීමටත් අවශ්‍ය බව ඉන් දෙදෙනෙක් ප්‍රකාශ කළහ.

- සිදුවීම් දෙකකදී (වවුනියාව හා මන්නාරම) ඔවුන් චූදිත නිලධාරියා අනෙකුත් කාන්තාවන්ගෙන් ලිංගික අල්ලස් ඉල්ලා සිටීම පිළිබඳ ව යම් සාක්ෂි එක්රැස් කරගෙන තිබුණි.

- මෙහි විස්තර කොට ඇති සිද්ධි 25 අතරින් කාන්තාවන් හය දෙනෙකු, අදාළ සිදුවීම පිළිබඳ ව පිටස්තරයකු සමග කතා කරන ලද්දේ පළමු වතාවට ය.

- නිල වශයෙන් පැමිණිලි ගොනු කර තිබුණේ කාන්තාවන් 07 දෙනෙකු පමණි.

- එසේ පැමිණිලි ඉදිරිපත් කළ කාන්තාවන්ට පවුලේ සහයෝගය පැවති අතර, එසේ නොමැති වූ කාන්තාවන් සිද්ධිය හෙළි කිරීමට පවා බිය වූහ. එමෙන්ම, නිරීක්ෂණයට බඳුන් වීම හා සමාජයෙන් කොන්වීම නිසා, ලිංගික අල්ලස් ඉල්ලා සිටි නිලධාරීන්ගේ අතවරයන්ට තවදුරටත් බඳුන් වීමට සිදුවනු ඇතැයි ඔවුහු ප්‍රකාශ කළහ. ඔවුන් තම දරුවන්ගේ ආරක්ෂාව ගැන බිය වූ අතර, ගැහැණු දරුවන් සිටී නම්, ලිංගික අල්ලස් ලබා ගැනීමේ සිදුවීම ප්‍රසිද්ධියට පත් වුවහොත් ඔවුන්ට සිදුවන ලැජ්ජාව පිළිබඳ ව ද කණගාටු වූහ.

- කිසිදු සැකකරුවකුට වෙනත් ස්ථානයකට මාරු කිරීම හැර චෝදනා ගොනු කිරීමක් සිදු වී නැත.

- බොහෝ දෙනා මෙය පොදුවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතු කරගත් ගැටලුවක් ලෙස දුටු නමුත්, මෙය ජනවර්ගයන්ට වෙනස් කොට සැලකීමක් ලෙස ද සමහරුන්ට දැනුණි.

## වැරදිකරුවන්/ චූදිතයින්

මෙම පර්යේෂණය විශේෂයෙන්ම පශ්චාත් යුධ සන්දර්භය තුළ යළි පැමිණීම, පුනරුත්ථාපන, යළි පදිංචි කිරීම හා සංවර්ධනය හා සම්බන්ධව, කාන්තාවන් ලිංගික අල්ලස්වලට හා සූරාකෑමට ලක් වීමට පවතින අවදානම පිළිබඳ ව හඳුනා ගනී. එමෙන්ම, යුද්ධයෙන් පීඩා විඳි කාන්තාවන් රාජ්‍ය ආයතන වෙත ප්‍රවේශ වීම සඳහා බලපාන මූලික හේතු නම් සත්‍යය, යුක්තිය හා වන්දි ගෙවීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉහත කාරණා සඳහා ඔවුන් ප්‍රවේශ වූ නිලධාරීහු එකී කාන්තාවන් ලිංගික සූරාකෑමට ලක්කොට තිබේ.

- නීතිය ක්‍රියාත්මක කිරීම සහ ආරක්ෂාව සම්බන්ධව කටයුතුකරන රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය සේවකයින් සහ නීති සේවාවන්
- මානුෂවාදී ආධාර සේවකයින්
- මනෝ වෛද්‍ය සමාජ සේවකයින්
- ආගමික නායිකයින්
- විශ්වවිද්‍යාල කථිකාචාර්ය

සිද්ධි අධ්‍යයනයන් තුළ සඳහන් වන බොහෝ නිලධාරීන් ලිංගික සූරාකෑම පිළිබඳ ව ඒ වන විටත් කුප්‍රකටව සිටි නමුත්, එකී සමාජ සිදුවීම් පිළිබඳ ව කිසිදු පියවරක් තවමත් නොගෙන ඇති බව සඳහන් කළ යුතුය.

## ලිංගික සූරාකෑමට ලක්වූ වින්දිතයන්ගේ තත්ත්වයන්

- විවිධ රජයේ සේවාවන් ලබාදීම සඳහා රජයේ නිලධාරීන් කාන්තාවන්ගෙන් ලිංගික උදව් ඉල්ලා තිබේ. *උදා : විවිධ පුනරුත්ථාපන සහ යළි පදිංචි කිරීමේ අවශ්‍යතා සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය වන ලේඛන හා පදිංචි සහතික සහ චරිත සහතික ලබාදීම සඳහා*

- නිලධාරීන් රැකියා හෝ ජීවනෝපාය සහායන් ලබාදීම සඳහා ලිංගික අල්ලස් ඉල්ලති.

- පවුලේ අතුරුදහන් වූ සාමාජිකයකු පිළිබඳ ව පැමිණිලි කිරීමට ගිය විට රජයේ නිලධාරීහු ලිංගික අල්ලස් ඉල්ලා ඇත.

- නිල කටයුතු සඳහා නීතිය ක්‍රියාත්මකකරන නිපධාරීන් වෙතට ගිය විට කාන්තාවන් ලිංගික සූරාකෑමට ලක් කළහ. *උදා: කිසියම් උත්සවයක් සඳහා අවසර ගැනීමට ගිය විට*

- වින්දිතයින්ගේ නීතිමය හා වෙනත් පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ප්‍රති උපකාරයක් ලෙස අධිකරණ නිලධාරීන් ලිංගික උදව් ඉල්ලා තිබේ.

- එකඟ නොවුවහොත් එය ඔවුන්ගේ අයහපතට බලපානු ඇතැයි තර්ජනය කරමින් රජයේ නිලධාරීන් කාන්තාවන් ලිංගික සූරාකෑමට ලක් කර තිබේ.
- කාන්තා ගෘහ මූලිකයින් උදව් ඉල්ලා නිලධාරීන් හමුවීමට ගිය විට, ඔවුන් ලිංගික අල්ලස් ඉල්ලා සිටීමේ ප්‍රවණතාවක් ද ඇත. *උදා: සේවාවන් සඳහා ප්‍රවේශය ඉක්මනින් ලබා දීම, ප්‍රතිලාභ ලබන්නන්ගේ නාම ලේඛනවල ප්‍රමුඛත්වය ලබාදීම, නුසුදුසුකම් නොසළකා ඔවුන් ආධාර වැඩසටහන්වලට ඇතුළත් කිරීම, දේශපාලන බලපෑම් හරහා ඔවුන්ට හෝ දරුවන්ට රැකියා ලබාදීම, කිසියම් වරදක් කළ විට ඔවුන් සඟවා තැබීම ආදිය.*

## ලිංගික සූරාකෑමේ විධි

- ස්ත්‍රී දූෂණය (සමහර අවස්ථාවලදී කිහිප වරක්)
- ලිංගික හිරිහැර හා නුසුදුසු ශාරීරික හැසිරීම
- ලිංගික සංසර්ගය ඉල්ලා සිටීම ඇතුළුව වාචික ලිංගික අතවර
- කිසියම් කාර්යයක් ඉටු කරවා ගැනීම සඳහා කිසියම් අන්දමකට හැසිරීමට/යම් හැසිරීමක් ඉවසා සිටීමට වාචිකව තර්ජනය කිරීම
- බොහෝ විට එම පුද්ගලයා බීමත්ව සිටින විට රාත්‍රී කාලයේ දුරකථනයෙන් හිරිහැර කිරීම
- යම් අවශ්‍යතාවයක් ඉටුකර ගැනීම සඳහා එම පුද්ගලයා තනිවම හමුවන ලෙස වින්දිතයන්ගෙන් ඉල්ලා සිටීම.

## සහන හෝ ප්‍රතිකර්ම ඉල්ලා සිටීමට කාන්තාවන් අසමත් වන්නේ ඇයි?

- යුක්තිය සොයා යාමට භාෂා අවහිරය බාධකයකි. *උදා: අල්ලස් කොමිසමේ නිලධාරීන් වින්දිතයා සමග කතා කරනුයේ සිංහලෙන් පමණි.*
- වරද සිදුකරන්නන් සාමාන්‍ය පුරවැසියන් නොව, බලවත් නිලයන්හි සිටින්නන්ය.
- කාන්තාවන්ගෙන් අඩක්ම ලිංගික අල්ලස් ලබා ගැනීම ශ්‍රී ලංකා නීතිය යටතේ වරදක් බව දැන සිටිය ද, පැමිණිලි කළ යුත්තේ කොතැනටදැයි බොහෝ දෙනාට පැහැදිලි අදහසක් නොවීය.
- ලිංගික අල්ලස් පිළිබඳ ගැටලු පිළිබඳ ව වත්මන් ව්‍යුහය නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න ගැන විශ්වාසයක් කාන්තාවන් 25 දෙනා අතුරින් 23 දෙනෙකු තුළම නොතිබුණි.
- පොලීසියට පැමිණිලි කිරීම පිළිබඳ ව බොහෝ දෙනා බරපතල ප්‍රකාශයන් කළ අතර, සමහර කණ්ඩායම් සාකච්ඡාවලදී, නීතිය ක්‍රියාත්මක කරන ව්‍යුහයන් තුළ සිදුවන දූෂණයන් හා ලිංගික බලපෑම් පිළිබඳ ව කාන්තාවෝ කතා කළහ.
- සමාජ නින්දාව
  - නුසුදුසු ලෙස හැසිරීම පිළිබඳ ව තමාට චෝදනා එල්ල වෙතැයි යන බියෙන් තනිවම සිටින බොහෝ කාන්තාවෝ එම සිදුවීම පිළිබඳ ව ළඟම මිතුරියකට හෝ පවුලේ සාමාජිකයකුට පවා කීමට පසුබට වූහ.
  - අඩුම තරමේ සිදුවීම් 05 ක දීවත්, තම මව, අසල්වැසියා හෝ නැන්දම්මා, නුසුදුසු ඇඳුම් ඇඳීම හෝ ලිංගික අල්ලස් ඉල්ලා සිටි නිලධාරියාට සමීප වීම පිළිබඳ ව තමාට චෝදනා කළ බව කාන්තාවෝ ප්‍රකාශ කළහ.
  - තමාට සිදු වූ දේ තවත් අයකුට පැවසීමෙන් ලැජ්ජාවන්නට සිදුවේය යන්න හෝ තම ප්‍රජාව හෝ පවුලේ සාමාජිකයින් සිට ගමන් බිමන් සීමා කරනු ඇතැයි යන්න ගැන, තනිවම සිටින බොහෝ කාන්තාවෝ බිය වූහ.
  - තමා බොහෝ කාලයක් පිරිමියකු නොමැතිව ජීවත් වූ නිසා, ලිංගික සූරාකෑම පිළිබඳ ව පැමිණිලි කළහොත් එය බොරුවක් හෝ හුදු මනෝ විකාරයක් ලෙස දකිනු ඇතැයි, අඩුම තරමේ කාන්තාවන් තුන් දෙනෙකුවත් ප්‍රකාශ කළහ.
  - පිරිමින් ආකර්ශනය වන්නේ තම කේශ කලාපයට යයි සිතූ එක් කාන්තාවක් සිය දිගු කොණ්ඩය කපා දැමීම පවා සිදු කළාය.

## ලිංගික සූරාකෑමට ලක් වූ වින්දිතයන් යොමු කළ හැකි ස්ථාන

ලිංගික සූරාකෑමට ලක් වූ කාන්තා ගෘහ මූලිකයින් සඳහා සහන සහ ප්‍රතිකර්ම සලසා දිය හැකි නීතිමය හා ආයතනික යාන්ත්‍රණයන් පහත ලැයිස්තුගත කොට තිබේ.

### නීතිමය

- මානව හිමිකම් කොමිසම
  ☎ : 011-2689064
- අල්ලස් කොමිසම
  011-2586257
- නීති ආධාර කොමිසම
  ☎ : 011-5335329/
  011-5335281
- කාන්තා පිහිට වැනි නීතිමය කටයුතු මෙහෙය වන රාජ්‍ය නොවන සංවිධාන
- රාජ්‍ය සේවා කොමිසම
  ☎:011-2136600/650/700
- ජාතික පොලිස් කොමිසම
  ☎ : 011-5107722

### ආරක්ෂක

- පොලිස් ස්ථානයේ කාන්තා හා ළමා කාර්යාංශය
  ☎:011-2826444/2768076
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාන්තා සංවර්ධන නිලධාරිනියන්
- කාන්තාවන්ට පිහිට වීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන හෝ ආගමික ආයතන විසින් පවත්වා ගෙන යන නිවාස

### වෛද්‍යමය

- ඕනෑම රජයේ රෝහලක ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය පිළිබඳ කාර්යාංශය

### මනෝ - සමාජ ආධාර

- ජාතික කාන්තා කමිටුව
  ☎ : 1938 හෝ
  011-2186063
- කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ළමා සහ කාන්තා සංවර්ධන ඒකක
- ප්‍රාදේශීය හා ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වන කාන්තා සංවිධාන (රාජ්‍ය නොවන/ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන)

### උපදේශනය

- කාන්තා පිහිට
  ☎ : 011-4718585
- කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය
  ☎:081-2234511/2228158

## නිර්දේශ

1. 'ලිංගික ත්‍යාග' යනු විශේෂිත ආකාරයක ත්‍යාග ලෙස ඇතුළත් කරමින් අල්ලස් පනත සංශෝධනය කළ යුතු අතර, ලිංගික ත්‍යාග සඳහා වන දඬුවම් වැඩි කළ යුතුය.

2. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සම්පාදනය කරන ලද, රාජ්‍ය ආයතනවල ලිංගික හිරිහැර වැළැක්වීම සඳහා වන මාර්ගෝපදේශ තුළට, ලිංගික අල්ලස් ලාබදීම පිළිබඳ ව වන පැමිණිලි ද ඇතුළත් විය යුතු අතර, එබඳු පැමිණිලි විභාග කිරීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව විශේෂ ක්‍රියාවලියක් සකස් කළ යුතුය.

3. සියලුම පශ්චාත් යුධ සේවා ව්‍යුහයන් සහ යෝජිත සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් තුළ සියලු තලයන්හි කාන්තා නියෝජනය 50%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වන බව තහවුරු කළ යුතුය.

4. පොලිස් කොමිසම, මැතිවරණ කොමිසම, අල්ලස් කොමිසම සහ රාජ්‍ය සේවා කොමිසම වැනි පවතින ස්වාධීන කොමිෂන් සභාවලට ලිංගික අල්ලස් විමර්ශනය කිරීමේ බලය ලබා දිය යුතුය. මෙම සියලු කොමිෂන් සභාවල ලිංගික අල්ලස් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමට හා මෙහෙයවීමට, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී, විශ්වසනීය ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය.

5. මහජන සේවා කොමිසම, පොලිස් කොමිසම හා මානව හිමිකම් කොමිසම ආදියෙන් ලබා ගත හැකි ප්‍රතිකර්ම යාන්ත්‍රණයන් පිළිබඳ ව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. එමගින් එකී යාන්ත්‍රණයන් හා ඒවාට ළඟා විය හැක්කේ කුමක් සඳහා ද යන්න පිළිබඳ ව කාන්තාවන් දැනුවත් කළ හැකිය.

6. ලිංගික අල්ලස් හා ලිංගික හිරිහැර සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිපත්තියක් (zero – tolerance policy) අනුගමනය කිරීම සඳහා සියලු රාජ්‍ය පරිපාලන/සේවා දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ට, ශ්‍රී ලංකා රජය විසින් චක්‍රලේඛනයක් නිකුත් කළ යුතුය. එය උල්ලංඝනය කිරීමක දී, එබඳු පැමිණිලි විභාග කිරීම සඳහා හැකියාව සහිත කමිටුවක ප්‍රබල විමර්ශනයන්ට ඒවා බඳුන් විය යුතුය.

7. ලිංගික අල්ලස් වැළැක්වීමට සහ ඒ පිළිබඳ පැමිණිලි විභාග කිරීමට, රාජ්‍ය සේවා සහ අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර යාන්ත්‍රණයන් හා මාර්ගෝපදේශ සකස් කළ යුතුය. එබඳු ක්‍රියාකාරකම්, කාන්තාවන්ට

පැමිණිලි කිරීම හා ප්‍රතිකර්ම ලබා ගැනීම දිරිමත් වන ලෙස, ප්‍රමාණවත් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සහයෝගිතාවය දක්වන පරිසරයක් සමග එක්ව සකස් විය යුතුය.

8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 919 දරන චක්‍රලේඛනය, නවක වදය පමණක් නොව ලිංගික අල්ලස් ලබා ගැනීම හා ලිංගික සූරාකෑම වැළැක්වීම ද ඇතුළත් වන ලෙස සංශෝධනය කළ යුතුය.

9. සමෘද්ධි නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, මහජන සෞඛ්‍ය නිලධාරීන් සහ කාන්තා ගෘහ මූලිකයින් සමග සෘජුව ගනුදෙනු කරන අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සඳහා ආචාරධර්ම මාලාවක් හඳුන්වා දිය යුතුය.

10. සියලු රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන, ලිංගික අල්ලස් ලබා ගැනීම පිළිබඳ ව වාර්තා වන සිදුවීම් පිළිබඳ ව දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම අනිවාර්ය කළ යුතුය.

11. ලිංගික අල්ලස් ලබා ගැනීමට අදාළ වන දඬුවම් පිළිබඳ නීති, පොලිස් ස්ථාන, විශ්වවිද්‍යාල, ප්‍රධාන පොදු ස්ථාන, පොදු ප්‍රවාහන සේවා සහ සියලු රාජ්‍ය ආයතනවල ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂාවලින් ප්‍රදර්ශනය කළ යුතුය.

12. පවත්නා පැමිණිලි කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ ව සහ පැමිණිලි යාන්ත්‍රණයන් පිළිබඳ ව, බිම් මට්ටමේ සිටින ජනතාවට රජය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය. මේ සම්බන්ධව නව ව්‍යවස්ථා/පරිපාලන චක්‍රලේඛන පනවන විට ඒ පිළිබඳ ව ද දැනුම් දිය යුතුය.

13. සියලු චක්‍රලේඛ හා දැනුවත් කිරීමේ වැඩසටහන් භාෂා තුනෙන්ම, විශේෂයෙන් සිංහල හා දෙමළ බසින් නිකුත් කළ යුතුය. ලිංගික අල්ලස් ලබා ගැනීම පිළිබඳ විමර්ශනයන් සිදු කිරීමේ දී සිංහල හා දෙමළ භාෂා ප්‍රගුණ කළ නිලධාරීන් යෙදවිය යුතුය. සිංහල හා දෙමළ භාෂා දෙකම ප්‍රගුණ කළ නිලධාරීන් මානව හිමිකම් කොමිසම, රාජ්‍ය සේවා කොමිසම හා ජාතික පොලිස් කොමිසම යන ආයතනවල සේවයේ යෙදවිය යුතුය.

14. ලිංගික සූරාකෑම සහ ලිංගික අල්ලස් ලබා ගැනීම පිළිබඳ ව කටයුතු කරන කේන්ද්‍රස්ථානය ලෙස කාන්තා සංවර්ධන නිලධාරිනියන් පත් කළ යුතුය. මනෝ වෛද්‍ය සේවා සඳහා යොමු කිරීම පිළිබඳ දැනුම හා පහසුකම් ඔවුනට ලබාදිය යුතුය.

15. ලිංගික සූරාකෑම හා ලිංගික අල්ලස් ගැනීමට ලක් වූ කාන්තාවන්ට ලබාගත හැකි සේවාවන් පිළිබඳ ව ආගමික නායකයින් දැනුවත් කළ යුතු අතර, ඔවුන් එම තොරතුරු පොදු මහජනතාව සමග බෙදාගත යුතුය.

16. මෙම සේවාවන් ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුවත් කිරීම සමග, මනෝ වෛද්‍ය උපකාර ප්‍රචලිත විය යුතුය.

## නිගමනය

- ලිංගික සූරාකෑම සහ කාන්තාවන් (හෝ පිරිමින්) වෙතින් කිසියම් සේවාවක් ලබා දීම වෙනුවෙන් ලිංගික උදව් ඉල්ලා සිටීම ශ්‍රී ලංකාවට නව ගැටලුවක් නොවේ. ඇත්තෙන්ම, පැතිරුණු හා ඉහළ යන තත්ත්වයක් ද වන අතර, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ව දඬුවමින් වැළකීමේ සංස්කෘතියක් ද ඊට එක් හේතුවකි.

- කෙසේවුවත්, වගවීම සහ යුද්ධය අවසන් වීමෙන් පසු ඇති ගැටලු සාකච්ඡාවට බඳුන් වන වත්මන් සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් තුළට, වැළැක්වීමේ ප්‍රතිපාදන ඇතුළත් කිරීමේ අරමුණින් මෙම පර්යේෂණය උතුරු පලාතේ පවත්වන ලදී.

- මෙම පර්යේෂණය වූ කලී ප්‍රතිසන්ධානය හා දිගුකාලීන සාමය සඳහා ක්‍රියා කරන ප්‍රතිපත්ති හා ව්‍යවස්ථා සම්පාදකයින්ට පූර්ව අනතුරු හැඟවීමකිශ්‍රී යමකු ඇතුළත් කර ගැනීමේ හා සාධාරණ සාමයක් ගොඩනැංවීමට යමකු අපේක්ෂා කරයි නම්, පශ්චාත් යුධ තත්ත්වය තුළ කාන්තාවන්ට එරෙහි සම්ප්‍රදායික අසමානතාවන් හා ව්‍යුහාත්මක වෙනස් කොට සැලකීම් අභියෝගයට පත් කිරීමේ අවශ්‍යතාව මෙම පර්යේෂණය තුළින් අවධාරණය කෙරේ.

- කාන්තා අයිතිවාසිකම් හා යුක්තියට ප්‍රවේශ වීම ක්‍රමිකව ළඟා කර ගැනීම - කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් හා තොරතුරු ලබා ගැනීමට හා තෝරා ගැනීමට කාන්තාවන්ට ඇති අයිතිය සම්බන්ධ නීති ශක්තිමත් කිරීම, වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයන් විශ්වසනීය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී බවට තහවුරු කිරීම; සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන්හි සියලු තලයන්හි කාන්තා ගෘහ මූලිකයින් ද ඇතුළු කාන්තාවන්ගේ සහභාගීත්වය හා ඇතුළත් කිරීම - ප්‍රතිපත්ති හා තීරණ ගැනීම කෙරෙහි වගකියන පුද්ගලයන් විසින්, පශ්චාත් යුද සන්දර්භය තුළ සාර්ථක ප්‍රතිසන්ධානයක් හා කල්පවත්නා සාමයක් සඳහා අවශ්‍ය තීරණාත්මක සාධක ලෙස හඳුනා ගත යුතුය.

British High Commission Colombo

FOKUS WOMEN

FOKUS
FORUM FOR KVINNER OG UTVIKLINGSSPORSMAL



ප්‍රකාශනය: ෆෝකුස් විමෙන් 34ඒ, සුලෙයිමාන් ඇවෙනියු, කොළඹ 05, ශ්‍රී ලංකාව. දුරකථන/ෆැක්ස්: +94112055404 වෙබ්: www.fokuskvinner.no

*සියළුම හිමිකම් ඇවිරිණි. මෙම ලේඛනය ප්‍රකාශන අයිතියට යටත් වන අතර විකිණිය නොහැකිය. ඉගැන්වීමේ කටයුතු සඳහා ඕනෑම ආකාරයට නැවත ඉදිරිපත් කළ හැකිය. එසේ නොවන අවස්ථාවන්වලදී ඡායා පිටපත් කිරීම, අනිකුත් ප්‍රකාශන සඳහා නැවත භාවිතය හෝ පරිවර්තනය කිරීම සඳහා ප්‍රකාශන අයිතිය හිමි අයගේ පූර්ව ලිඛිත අවසරය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.*